Advertisement දැන්වීමක්

# එක්සත් රාජධානියේ ලාංකික දේශප්‍රේමීනි පිබිදෙව් !

# Sri Lankan Patriots in the UK... Awake!



★ අපේ වීරෝදාර හමුදා රුදුරු කොටි ග්‍රහණයෙන් අප මව්බිම ස්ථිර වම මුදාගැනීම සඳහා ජීවිත කැප කරමින් උතුරේ කොටි ප්‍රදේශ තුළම ඉතා තියුණු සටනක යෙදී සිටිති.

★ අධිකව නැග එන ජීවන වියදම, දුක් කම්කටොළු, දුෂ්කරතා සිංහළ, දෙමළ, මුස්ලිම් ආදී වූ සකල ලාංකික ජනතාවම විඳ දරාගනිමින් අනාගත බලාපොරොත්තු ඇතිව අපේම වීරෝදාර දූ පුතුන් වන මේ හමුදාවනගේ පරිශ්‍රමයට සහයෝගය දෙමින් සිටිති. දේශප්‍රේමී දේශපාලකයින්ද, රජයද මේ සටනට දේශපාලන නායකත්වය දෙමින් සිය කොටස ඉටුකිරීම සතුටකි.

★ ඉදිරියට යන හමුදා ප්‍රහාරවලින් කොටිකඳවුරු විනාස වෙද්දී පරාජයේ ලකුණු ඉව වැටුණු කොටි දැන් ම්ලේච්ඡ ලෙස තැන් තැන් වල සහ බස් රථවල බෝම්බ පුපුරවමින් අහිංසක සිවිල් වැසි යන් ඝාතනය කිරීමට පටන් ගෙන ඇත.

★ එක්සත් රාජධානියේ සිටින අපේ පැත්තෙන් බලනවිට පෙනෙනුයේ කොටින්ට අවාසිවන විට කුලප්පු වන අනෙක් අය නම් එක්සත් රාජධානියේ කොටින්ට සහාය දෙන සමහර ලේබර් සහ ලිබරල් ඩිමෝක්‍රැටික් පක්‍ෂ මන්ත්‍රීන් කණ්ඩායම් ය.

★ අසූ ගණන් වල සිට සරණාගත මුවාවෙන් මේ රටට පැමිණි ද්‍රවිඩයින් විශාල සංඛ්‍යාවක් ලන්ඩන් සහ ඒ අවටද, ප්‍රධාන නගරවල මන්ත්‍රී කොට්ඨාශ වල එකට ගොනුවී පදිංචිව සිටින බව අපි දනිමු. මේ සියළු දෙනා **100%** ක් කොටි සපෝටර්ලා නොවුවද ඒ අය අතරට වැදුණු සංවිධානය වූ ලන්ඩනයේ කොටි ඒ ජන සංඛ්‍යාව ආයුධයක් ලෙස හසුරුවමින් ඒ ඒ ප්‍රදේශ වල මන්ත්‍රීවරුන්ට කිට්ටු වී බලපෑම් කරන බව නොරහසකි.

★ ඉරාක යුද්ධයෙන් බලයේ සිටින ලේබර් පක්‍ෂය අත පුළුස්සා ගැනීම නිසා කලින් ඒක රාශිව සහාය දුන් මුස්ලිම් ජනතාව ලේබර් පක්‍ෂයෙන් අයින් වූහ. ඒ අඩුව පුරවන්නට කොටි ඡන්ද බ්‍රෝකර්ලා ඒ මන්ත්‍රීවරුන්ට කිට්ටු වූහ. යාන්තම් සුළු ගණනකින් ඡන්දයෙන් දිනූ මන්ත්‍රීවරුන්ට ඊළඟ වතාවේ කෙසේ හෝ දිනන්නට ඡන්ද අවශ්‍යයව ඇත. මෙයින් ප්‍රයෝජනය ගත් කොටි තමන් ළඟ විශාල සංඛ්‍යාවක් දෙමළ ඡන්ද තිබෙන බවත්, ඒවා අවශ්‍ය නම් ලංකාවේ පවතින දෙමළ අරගලයට සහාය පළකරන ලෙසත් ඉල්ලමින් බලපෑම් කරන්නට පටන් ගත්හ.

★ ගිය වසරේ මැයි මාසයේ ලේබර් පක්‍ෂයේ කීත් වාස් නම් මන්ත්‍රීවරයා ප්‍රමුඛ කණ්ඩායමක් **ද්‍රවිඩයින් සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කණ්ඩායම** නමින් කණ්ඩායමක් සෑදී **ලංකාවේ ද්‍රවිඩයන්ගේ ප්‍රශ්නය** යන මුවාවෙන් පාර්ලිමේන්තු විවාදයක් පැවැත්වූහ. එහිදී කතා කළේ ද්‍රවිඩ ජනතාවගේ පොදු ප්‍රශ්න යන මුවාවෙන් කොටින්ට සුදුහුණු ගාන්නට මහන්සි ගත් අර මුලදී සඳහන් කළ මන්ත්‍රීන්ය. කොටි ප්‍රචාර වලින් හැමදාමත් දෙන විකෘති පින්තූරය මතුකරමින් ඔවුන් කතා කළේ එදා මහජන ගැලරියේ පිරී සිටි කොටි නියෝජිතයන් පිනවීම පිණිසය.

★ විවාද වාර්තා විමසිලිමත්ව කියවන විට පෙනී යන්නේ කොටින්ට පක්‍ෂ මන්ත්‍රී කණ්ඩායම එකම දේ කොටින්ට පක්‍ෂ වනසේ පුන පුනා ඉදිරිපත් කිරීමය. එයට පටහැනි සමබර අදහසක් හෝ දැක්වූවේ ඉඳ හිට කතා කළ, යම් තතු දන්නා කොන්සර්වේටිව් පක්‍ෂයේ හෝ ලේබර් පක්‍ෂයේ මන්ත්‍රීවරයෙකු පමණි.

## අප කළ යුතු දේ

★ කොටින් මේ රටේ ගොඩනගා ඇති බොරු ප්‍රචාර බිඳ දැමීම වහා ඇරඹිය යුතුය. කොටින්ට සම්බන්ධ නැති, උන්ට විරුද්ධ සිංහල, දෙමළ, මුස්ලිම් සහ බ්‍රිතාන්‍යයින් විශාල සංඛ්‍යාවක් මෙහි වෙති. මේ සැමටම මේ රටේ බලපෑමක් කිරීමට අවශ්‍ය වන ප්‍රබලම අයුධය වන ඡන්ද බලය ඇත.

★ සමාන අදහස් ඇති මේ අය ඒකරාශිවී කොටි දුර්මත බිඳලීමට කරුණු රැස්කර ගොනුකරමින් ඉදිරි අරමුණු සැකසිය යුතුය.

★ මුළු මහත් බ්‍රිතාන්‍යය පුරා විසිරී සිටින අප ඊමේල් හා වෙබ් අඩවි මගින් හා රැස්වීමෙන් හා කතිකාවෙන් ඒකා බද්ධ විය යුතුය.

★ වැඩිමනත් තව වසර දෙකකින් පැවැත්වෙන බ්‍රිතාන්‍ය මහා ඡන්දයේදී බලපෑම් කළ හැකි ප්‍රබල ව්‍යාපාරයක් ගොඩනැගීම සහ අරමුණ සැකසීම දැන් සිට ම කළ යුතුය. හැම ප්‍රදේශයකම ඡන්ද කොට්ඨාශයකම පක්‍ෂ තුනේ මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීධුරාපේක්‍ෂකයින්ට අප පැත්තෙන් කරුණු ඉදිරිපත් කොට සම්බන්ධතා ගොඩ නැගීම සහ බලපෑම් කිරීම වහා ඇරඹිය යුතුය.

★ ජීවිත පරදුවට තබා අප රටේ ජනතාව සහ ආරක්‍ෂක හමුදා පෙරමුණ ගෙන කරන සටනට අප ඉන්නා මේ රටේ අපගේ අරමුණ විය යුත්තේ කොටින්ගේ මේ නීච ප්‍රයත්නයන් දුර්වල කිරීම සහ ඒවා වළක්වාලීමය. එයින් පසු තව ඉදිරියට යාමය. එය ඉටු කළ හැකි, ඉටු කළ යුතු කාර්යයයි. එය අපි වහා අරඹමු එයට ඔබත් නොපමාව එක්වන්න ! පෙරමුණ ගන්න ! පිබිදෙන්න !

★ මේ විද්‍යුත් ලිපිනයට ඔබ අදහස් දක්වා අප හා ආරම්භක සම්බන්ධතාවක් ගොඩනගාගන්න ! ජයවේවා ! **venura . dias @ gmail . com**

**O**ur armed forces are in the middle of a hard struggle today to rid the country of the scourge of Tiger terrorism which has been hampering us for quite some time. The armed forces have intensified the attacks on them moving almost to their headquarters in Killinochi itself.

**C**ornered in their bunkers and facing inevitable defeat, the Tigers are behaving like wild beasts gone berserk and have started the indiscriminate massacre of large numbers of civilians resorting to their usual cowardly weapons of suicide and remote control bombs.

**P**atiently bearing up all these hardships and provocations the patriotic people and the political groups in the country are fully backing the valiant efforts of the armed forces in this noble task to bring peace to our land in the near future.

## The picture here in the U.K.

**A**part from the vicious and blatantly false propaganda, the Tiger organisers entrenched within the tamil diaspora here are fully active, using the tamil voter numbers as a tool to influence the parliamentarians here to move on Sri Lankan affairs. The aim is to get the British government to pressurise the Sri Lankan government at this juncture. We know that this has always been the case whenever the Tigers are facing difficulties. The false picture presented is that the helpless tamil people are suffering under a war conducted by the Sinhala government against them.

## What needs to be done ?

**U**rgent action is needed to demolish these false images and give a true picture of the real situation there and the immense problems faced continuously by all Sri Lankans there harassed by one of the most ruthless terrorist groups in the world ever.

**S**eparate from the Tiger terrorists and/or their sympathisers, there is a large number of Sri Lankans who are opposed to the Tigers or who have no truck with them what so ever.

**A**ll of these too have the right to vote here which collectively is a most potent weapon in influencing opinion in this country.

**W**e must not forget that properly organised, Sri Lankans who are not with the Tigers are the larger group and are capable of putting more pressure on any issue.

**T**hese like minded patriots need to form a group or groups and collect information, data, views and opinions on the current developments. Also build up ways means and strategies to counter the false propaganda the Tigers are continuously spreading. These activities will lead the way for us to develop programmes of further action.

**W**e, who are scattered all over the U.K. must build up links and communicate views through a centre initially and progress to build up a web site making full use of electronic media. Where possible we can form and meet personally as groups and build up a network for a common purpose.

**The aim should be to grow into a movement strong enough to influence in the British general elections scheduled to take place within the next two years.**

These are only a few initial ideas. We know that many new ideas will definitely be forthcoming. Welcome!

## A CALL FOR URGENT ACTION

Our people and the armed forces are fighting on a front in our country at the cost of precious lives. The front we must fight in here should be to expose and demolish the dirty tactics of the tigers on the international front and hit them hard.

**This is a task we can do and should do.**

**SO JOIN TOGETHER FOR THESE NOBLE TASKS.**

**MOVE FORWARD ! AWAKE !**

**venura.dias@gmail.com**